ශ්‍රී ලංකා සෞඛ්‍ය විභාගය 5553

නාමික පරීක්ෂණය - 2022

පත්‍රය අංක 1

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ (MCQ) ප්‍රශ්න 40 කින් සහ පිටු 6 කින් සමන්විත වේ.

විභාග අපේක්ෂකයින් සඳහා උපදෙස්:

1. සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුයි.
2. ඔබට ලබා දී ඇති බහුවරණ (MCQ) පිළිතුරු පත්‍රයේ නිවැරදි පිළිතුර අංකයට හරස් ඉරක් මගින් ලකුණු කළ යුතුයි.

---

1. ප්‍රථමාධාරය යනු කුමක්ද?
   - I. ප්‍රථම වරට රෝගියා විනිශ්චය කිරීම.
   - II. රෝගියාගේ රෝග ලක්ෂණ නිරීක්ෂණය කිරීම.
   - III. හදිසි අනතුරකදී හෝ රෝගී තත්වයකදී වෛද්‍යාධාර ලැබෙන තෙක්, ප්‍රථමාධාර පුහුණු වූ අයෙකු විසින් ලබාදෙන ආධාර.
   - IV. රෝගියාගේ තත්වය නිරීක්ෂණය කර වහා රෝහලේ ගත කිරීම.

2. ප්‍රථමාධාරය කොටස් තුනකින් සමන්විත වේ.
   - I. රෝග විනිශ්චය/ප්‍රතිකාරය/භාරදීම
   - II. රෝග ලක්ෂණ බැලීම/නාඩි බැලීම/ප්‍රතිකාරය
   - III. හුස්ම ගැනීම පරීක්ෂා කිරීම/නාඩි බැලීම/රෝග ලක්ෂණ නිරීක්ෂණය කිරීම
   - IV. රෝග ඉතිහාසය බැලීම/රෝග ලක්ෂණ බැලීම/ප්‍රතිකාරය

3. ප්‍රථමාධාර සැපයීමේදී ඔබගේ අවධානය යොමු විය යුතු වන්නේ,
   - I. යම් පුද්ගලයකුගේ ජීවිතය බේරා ගැනීමට කටයුතු කිරීම.
   - II. යම්කිසි අනතුරකට ලක්වූ අයකු සහ ඒ අවට සිටින අයගේ සහ ඔබගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වීම.
   - III. රෝගියාගේ හෝ අනතුරට ලක්වූ කෙනෙකුගේ එම තත්වය උත්සන්න නොවීමට කටයුතු කිරීම.
   - IV. ඉහත සඳහන් සියල්ලම.

4. කොළඹ සහ දිවයිනේ ඇතැම් ප්‍රදේශවල අය කිරීමෙන් තොරව ක්‍රියාත්මක වන සුවසැරිය ගිලන් රථ සේවයේ දුරකථන අංකය.

   I. 1901    II. 1900    III. 1990    IV. 1910

5. ප්‍රථමාධාරයේ DRSCAB වලින් හඳුන්වන්නේ

| | D | R | S | C | A | B |
|---|---|---|---|---|---|---|
| I. | Danger<br>අනතුර | Recue<br>මුදාගැනීම | Symptoms<br>රෝගලක්ෂණ | Circulation<br>රුධිර සංසරණය | Ambulance<br>ගිලන් රථය | Breathing<br>ශ්වසන පරීක්ෂාව |
| II. | Doctor<br>වෛද්‍යවරයා | Recue<br>මුදාගැනීම | Signs for Breathing<br>ශ්වසනය කරන බවට සලකුණු | Compression<br>පපු තෙරපුම | Ambulance<br>ගිලන් රථය | Blood Pressure<br>රුධිර පීඩන පරීක්ෂාව |
| III. | Danger<br>අනතුර | Repond<br>ප්‍රතිචාර | Send for help<br>උදව් ඉල්ලන්න | Circulation<br>රුධිර සංසරණය | Airway<br>ශ්වසන මාර්ගය විවෘත කරන්න | Breathing<br>ශ්වසන පරීක්ෂාව |
| IV. | Doctor<br>වෛද්‍යවරයා | Recue<br>මුදාගැනීම | SMS for help<br>උදව් සඳහා කෙටි පණිවිඩයක් යැවීම | Circulation<br>රුධිර සංසරණය | Airway<br>ශ්වසන මාර්ගය විවෘත කරන්න | Breathing<br>ශ්වසන පරීක්ෂාව |

6. බිම වැටී සිටින කෙනෙකු හුස්ම ගන්නේ දැයි පරීක්ෂා කර බැලිය හැක්කේ,

I. බඩ සහ පපුව උස් පහත් වන බව බැලීම.

II. නාසය සහ මුඛය ලගට ඔබගේ කණ තබා හුස්ම ගන්නේ දැයි බැලීම.

III. පපුව සහ බඩ ප්‍රදේශයට අත තබා එම ප්‍රදේශයන්හි සෙලවීමක් ඇත්දැයි බැලීම.

IV. මෙම සියළුම කරුණු.

7. ඔබ ගමනක් යන විට පාරේ කෙනෙක් වැටී ඇත. ඔබ ඔහු වෙත ගොස් උසහිසට තට්ටු කර කතා කළත් ප්‍රතිචාර නොදක්වයි. ඔහු වමනය කර ඇති බවද පෙනේ. ඔහු හුස්ම නොගන්නා බවත් පෙනී යයි. උදව් ඉල්ලා ගිලන් රථයක් අමතන්න යැයි කෙනෙකුට පැවසීමෙන් පසු ඔබ කළ යුත්තේ,

I. වහාම ඔහුගේ වමනය කටින් පිසදැමීමට තැත් කිරීම.

II. ඔහුව පැත්තකට හැරවීම.

III. වහාම CPR පපු තෙරපුම පමණක් ලබාදීම.

IV. ඔහුව කෙලින් අතට තබා කකුල් දෙක උස්කර තැබීම.

8. RICE ප්‍රතිකාරය ලබා දෙන්නේ,

I. කෙනෙකු සිහිසුන්ව වැටී සිටින අවස්ථාවකදී.

II. කෙනෙකුගේ පාදයක් උළුක්කු වී ඇති අවස්ථාවකදී.

III. යම්කිසි කෙනෙකුට යමක් හිරවී ඇති විට

IV. ඉහත සඳහන් සියල්ලම අසත්‍ය වේ.

9. RICE ප්‍රතිකාරය යනු අනුපිළිවෙලින්,

I. නිශ්චල කිරීම (විවේකීව තැබීම), අයිස් තැබීම, සෘජු පීඩනය, මදක් ඔසවා තැබීම.

II. පතුරක් බැඳීම, සෘජු පීඩනය, පටියකින් වෙලීම, බීමට (Aspirin) පෙත්තක් ලබාදීම.

III. වතුර බීමට ලබාදීම, බාම් ආලේප කිරීම, සෘජු පීඩනය, මදක් ඔසවා තැබීම.

IV. පටියකින් වෙලීම, බාම් ආලේප කිරීම, වැරෙන් කකුල පිරිමැදීම, අයිස් තැබීම.

10. යම් කෙනෙකුට උගුරේ හිරවීමට (Chocking) හැකියාවක් ඇත්තේ,

I. වතුර

II. බත්

III. දියර කිරි

IV. පැණි බීම

11. ඔබගේ මිතුරා සමග ආහාර ගනිමින් සිටින විට, ඔහු හදිසියේම උගුර අතින් අල්ලාගෙන මුහුණ රතු වී ඔබ දෙස බලා සිටියි. ඔහුගේ උගුරේ යමක් හිරවී ඇතැයි, ඔහු අතින් කියයි. ඔබ කළ යුත්තේ,

I. ඔහුට බීමට වතුර ලබාදීම.

II. ඔහුගේ ඔළුව පාත් කර පිටට තට්ටු කිරීම.

III. ඔහුට නාසයෙන් හුස්ම ගන්නයි උපදෙස් දී, පිටට තට්ටු කිරීම.

IV. ඔහුගේ පිටට පස් වතාවක් වැරෙන් පිටට තට්ටු කිරීම සහ ඔහුට පිටුපසින් පැමිණ බඩ ප්‍රදේශය තෙරපීම. (Abdominal Thrust)

12. කෙනෙකුට CPR දිය යුත්තේ,

I. ක්ලාන්ත ගතියක් ඇතැයි රෝගියා විසින් පවතින අවස්ථාවකදී.

II. රෝගියා බිම වැටී ඉතාමත් දුර්වල ලෙසට හුස්ම ගැනීමට අපහසු බව පවසන විට.

III. රෝගියා සිහි නැවතී, නොසෙල්වී හුස්ම නොගෙන සිටින විට.

IV. රෝගියා දරුණු ලෙසට පපුවේ රිදීමක් ඇති බව පවසන විට.

13. ලේ ගැලීමකදී ප්‍රථමයෙන් කළ යුත්තේ,

I. තුවාලය ගලා යන වතුරෙන් සේදීම.

II. තුවාලය මතට අයිස් තැබීම.

III. තුවාලය මතට පීඩනයක් යෙදීම.

IV. තුවාලය ස්ප්‍රේ/යේලයින් වලින් සේදීම.

14. කෙනෙකුගේ කකුලේ විශාල වීදුරු කැබැල්ලක් ඇනී ඇතුලට ගොස් ලේ ගලමින් ඇත. ප්‍රථමාධාරකරුවෙකු වශයෙන් ඔබ පළමුවෙන්ම කළ යුතු දේ නම්,

I. එම වීදුරු කැබැල්ල ඇද දමා ලේ ගැලීම පාලනය කිරීම.
II. එම වීදුරු කැබැල්ල තිබියදී එය වටා පීඩනයක් (අනියම් පීඩනයක්) යොදා ලේ ගැලීම පාලනය කිරීම.
III. වහාම ඔහුව රෝහලකට ගෙන යෑම සඳහා ආධාර ඉල්ලීම.
IV. II සහ III පියවර දෙකම ගැනීම.

15. යම්කිසි කෙනෙකුගේ ඇඟිල්ලක් කැපී වෙන්වී ඇත. එම කැපී වෙන්වී ඇති ඇඟිල්ල සඳහා කළ යුත්තේ,

I. විෂබීජ නැසූ (Sterile) ගෝස් කැබැල්ලකින් එය එතීම.
II. එය ප්ලාස්ටික් බෑග් එකකට දැමීම.
III. එම ප්ලාස්ටික් බෑග් එක අයිස් මත තබා තුවාලකරු සමග හැකි තරම් ඉක්මනින් රෝහලට ගෙන යෑම.
IV. ඉහත සියල්ලම කළ යුතුයි.

16. ඇට බිඳුමකදී (Fracture) සාමාන්‍ය ලක්ෂණයක් නොවන්නේ,

I. අධික වේදනාව.
II. ඉදිමුව
III. ඇට බිඳුමකදී ඇති වී තිබෙන අත හෝ කකුල ඇද වී තිබීම.
IV. අධික ලෙස දහඩිය පිටවීම.

17. ගොඩනැගිල්ලක ගින්නකට හසුවී කෙනෙක් බලවත් සේ පිලිස්සී ගොඩනැගිල්ල තුල සිටින බව ඔබට දැන ගැනිමට ලැබේ. ප්‍රථමාධාරකරුවෙකු වශයෙන් ඔබ පළමුවෙන්ම අවධානය දිය යුත්තේ,

I. එම ස්ථානය ආරක්ෂිත ද බැලීම.
II. රෝගයාගේ නාඩි පරීක්ෂා කිරීම.
III. රෝගියා හුස්ම ගන්නේ දැයි බැලීම.
IV. පිලිස්සුණ පෙදෙස සිසිල් කිරීම.

18. තුන්වන මට්ටම පිලිස්සීමේ රෝග ලක්ෂණ මොනවාද?

I. පිලිස්සුනු සම, වේදනාවක් නැත.
II. පිලිස්සුනු සම, වේදනාවක් ඇත.
III. දිය බිබිලි සහ වේදනාව
IV. රතු සම සහ වේදනාව නැත.

19. ඔබගේ සහෝදරයාගේ අත පිලිස්සී ඔහු වේදනාවෙන් කෑ ගයයි. ඔහුගේ අත වතුර කරාමයකට කොපමණ වේලාවක් අල්ලා තැබිය යුතුද?

I. මිනිත්තු 5 - 10 අතර
II. මිනිත්තු 20
III. මිනිත්තු 30
IV. වතුර ඇල්ලීම කළ යුතු නැත.

20. CPR දීමේදී පපු තෙරපුම කළ යුත්තේ,

I. පියයුරු අස්ථියේ පහළ භාගය.
II. තන පුඩු දෙක අතර පපුවේ මැද.
III. ඉල ඇටයට මඳක් පහලින්, ඉහල උදරය
IV. ඉල ඇටයට උඩින්, පපුවේ වම් පැත්ත.

21 වයස අවුරුදු 1 - 8 දරුවෙකුට CPR ලබා දිය යුත්තේ,

I. පපු තෙරපුම වාර 30 ශ්වසන වාර 2
II. පපු තෙරපුම වාර 30 ශ්වසන වාර 3
III. පපු තෙරපුම වාර 35 ශ්වසන වාර 2
IV. පපු තෙරපුම වාර 35 ශ්වසන වාර 1

22. රෝගියෙකුට CPR දීම නැවැත්විය හැක්කේ,

I. CPR දීම පටන් ගෙන මිනිත්තු 15 කට පසුව
II. ගිලන් රථය පැමිණ Paramedic විසින් රෝගියා භාරගත්විට.
III. රෝගියා සාමාන්‍ය ආකාරයට හුස්ම ගන්නා විට.
IV. දෙක සහ තුන්වන අවස්ථාවලදී.

23. නාසයෙන් ලේ ගලන විට කළයුතු ප්‍රථමාධාරය වනුයේ,.

I. හිස පිටුපසට නැඹුරු කර නාසය තද කර, කටින් හුස්ම ගැනීමට සැලැස්වීම.
II. නාසය තද කර, හිස මදක් ඉදිරියට නමා පුටුවක වාඩි කරන්න. කටින් ශ්වසනය කිරීමට සලස්වන්න.
III. නාසය මත අයිස් තබා රෝගියා බිම දිගා කරවීම.
IV. ඉහත සඳහන් සියල්ලම වැරදියි.

24. බල්ලෙකු සපා කෑ විට ප්‍රථමයෙන් සිදු කළ යුත්තේ.

I. වේදනාව අඩු කිරීමට ඇස්ප්‍රින් පෙත්තක් ලබාදීම.
II. ලේ ගැලීම නැවැත්වීම සඳහා තදින් රෙදි පටියකින් වෙලීම.
III. අදාළ ස්ථානය සබන් ගා හොඳින් සෝදා, අනතුරුව ලේ ගැලීම පාලනය කිරීමට පිරිසිදු රෙදි පටියකින් ලිහිල් ලෙස වෙලීම.
IV. ඉහත සඳහන් කිසිවක් නොකර, හැකි පමණ ඉක්මනින් රෝහල් ගත කිරීම.

25. පහත සඳහන් නිවැරදි ප්‍රකාශය තෝරා ගන්න.

I. බල්ලෙකු සපා කෑ විට සබන් ආලේප නොකළ යුතුයි.
II. ක්ලාන්තය ඇති රෝගියෙකු සුවවීමේ ඉරියව්වට (Recovery Position) පත්කළ යුතුයි.
III. උගුරේ යමක් හිරවී ඇති පුද්ගලයෙකුට බීමට වතුර ලබා දීම.
IV. ලේ ගැලීමක් පාලනය කරන ප්‍රධානතම ක්‍රමය කෙලින් පීඩනයක් යොදවයි. (මේ සඳහා පිරිසිදු රෙදි කඩක් සැරහුමක් ලෙස භාවිතා කරයි.)

26. ඔබගේ මවගේ කකුළ ඇය ගෙදර වැඩ කරමින් සිටින අතර උළුක්කු වී ඇත. කකුළ අල්ලාගෙන වේදනාවෙන් සිටියි. ඔබ කළ යුත්තේ කුමක්ද?

I. වහාම සිද්ධාලේප හෝ වෙනයම් ආලේපනයක් ගෑම.
II. ආබාධිත ස්ථානය විවේකීව තබා එම ස්ථානයට අයිස් තබා වෙලුම් පටියක් දමා උඩට ඔසවා තැබීම.
III. වහාම ඇයව රෝහලකට ගෙන යාමට කටයුතු කිරීම.
IV. ඇයව වාඩිකර තබා, වහාම බීමට යමක් ලබාදීම.

27. කුඩා ළදරුවෙකුට (මාස 12ට අඩු) පපු තෙරපුම දෙනු ලබන්නේ,

I. එක අතකින් පමණි
II. අත් දෙකින්ම
III. එක ඇඟිල්ලකින් පමණි
IV. ඇඟිලි දෙකකින්

28. ලේ ගලන තුවාලයකට පිරිසිදු රෙදි කැබැල්ලකින් පීඩනයක් යොදන්නේ,

I. වේදනාව නැවැත්වීමට
II. ලේ ගැලීම සම්බන්ධව තුවාලකරුගේ අවධානය වෙන අතකට යොමු කිරීම හා ක්ලාන්තය ඇතිමෙන් වැළැක්වීමට.
III. ලේ ගැලීම අඩු කර ලේ කැටි ගැසීම සඳහා
IV. විෂබීජ ඇතුළුවීම වැළැක්වීමට

29. යම් අයෙකු විසඥතාවයට පත් වී ඇත. ඔහුව නිරීක්ෂණය කිරීමේදී හුස්ම ගැනීම සහ හෘද ස්පන්දනය විධිමත්ව පවතී. අදාල ප්‍රථමාධාරය වන්නේ.

I. වහාම CPR ලබාදීම.
II. ආරක්ෂිත ඉරියව්වේ (Recovery Position) තැබීම.
III. හිසට අයිස් තැබීම.
IV. බිම දිගාකර දෙපා ඔසවා තැබීම.